# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2337/06 – 2023 ජුනි මස 19 වැනි සඳුදා – 2023.06.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/148.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.10.29 දිනැති හා අංක 2251/60 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.08.10 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගෝවින්න, කොබවක, ''රෝහණ'' හි පදිංචි රෝහණ ආනන්ද කුමාරනායක මයා සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, ජනවතු පියස, අංක 320 හි පිහිටි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 39736 – 18 (2023/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

1. රෝහන ආනන්ද කුමාරනායක මහතා
"රෝහන", කොබවක
ගෝවින්න.

එදිරිව

*පළමුවැනි පාර්ශ්වය.*

*නඩු අංකය*: A/62/2021.
*ගොනු අංකය*: IR/COM/03/2018/148

2. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
අංක. 320,
ජනවතු පියස, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරවුල

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ

"රෝහන ආනන්ද කුමාරනායක මහතාට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් 1997.03.01 වන දින සිට අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඔහුට පෞද්ගලික වන සේ ලබා දී ඇති රු. 190,140/- වන වැටුප් පියවර අඛණ්ඩව වසර 09 ක් භුක්ති විඳිමින් සිටියදී 2006.09.28 වන දිනැති ආයතනයේ ලිපිය මගින් එකී භුක්ති විඳි වැටුප රු. 168,060/- දක්වා අඩු කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ."

**පෙනී සිටීම**

පළමුවන පාර්ශ්වය වන ඉල්ලුම්කරු සහ ඔහු වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ආර්. එම්. එන්. බන්ඩාර මහතා සහ ඔහුට බලය පැවරූ ලිපියක්ද සමග පෙනී සිටින ලදී.

**ප්‍රදානය :**

පළමුවැනි පාර්ශ්වය විසින් සහ දෙවන පාර්ශ්වය විසින් ඔවුන්ගේ පළමු සහ දෙවන ප්‍රකාශ ඉදිරිපත් කරන ලදී. ඉන්පසු පළමුවන පාර්ශ්වය ඉල්ලුම්කරු විසින් සාක්ෂි ලබාදෙමින් සහ A1 සිටA9 දක්වා ලේඛන ගොනු කරමින් ප්‍රකාශ කරනු ලැබුවේ ඔහු 1986 වර්ෂයේ කාර්මික අධ්‍යාපන සේවයේ රු. 144,060/- ක වැටුප් පියවරේ සේවය කළ බවත්, 1997.01.10 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් මත උසස් අධ්‍යාපන ආයතනයට 1997.03.01 දින සිට රු. 184,620/- ක වැටුප් පියවරේ පිහිටුවා උසස් අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය ධුරයට පත් කර, පසුව උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂක ජෙනරාල් විසින් 2003.03.21 වන දින දරන ලිපිය මගින් ඉල්ලුම්කරුගේ වැටුප 1997.03.01 වන දින සිට රු. 190,140/- වැටුප් පියවරේ තැබූ බවට සාක්ෂි දෙන ලදී.

ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ 1997.03.01 දින සිට ඉහත කී වැටුප් පියවර ලැබිය යුතු බවට වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව වාර්ථාව මගින් ද, අනුමත කර ඇති බවත්ය.

එසේම 2000.08.30 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 92/2000 එකී වැටුප වන රු. 190,140/- ඉල්ලුම්කරු හට පෞද්ගලික වනසේ ලබාදිය යුතු බවට තහවුරු කරන ලද බවත්, එකී තහවුරු කිරීම් එකි කරුණු උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂක ජෙනරාල්ගේ 2000.11.29 දරන ලිපිය මගින්ද තහවුරු කරන ලද බවත්, එසේ ඉල්ලුම්කරු විසින් 1997.03.01 සිට ගිවිසුම් සහගතව භුක්ති විඳි වැටුප වන රු. 190,140/- උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ 2006.09.28 දින ලිපිය මගින් ඉල්ලුම්කරුගේ වැටුප් තලය 1997.03.01 දින සිට රු. 168,060/- වන සේ සංශෝධනය කරන ලද බවටත් සාක්ෂි දෙන ලදී.

මෙහි දී ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින්නේ ගිවිසුම් සහගතව භුක්ති විඳි වැටුප කිසිදු සාධාරණ සහ යුක්ති සහගත හේතුවකින් තොරව අඩු කිරීම අසාධාරණ සහ අයුක්ති සහගත බවත් ය.

ඒ අනුව ඉල්ලුම්කරු ඔහු සාක්ෂි දෙමින් ගරු අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ ඔහුට වාර්ෂිකව රු. 22,080/- ක පමණ අලාභයක් සිදු වූ බවත්, ඔහු විශ්‍රාම ගොස් ඇත්තේ, භුක්ති විඳිමින් සිටි වැටුප අඩුකළාට පසුව බවත්, ඒ අනුව ETF, EPF සියල්ල අඩු වූ බවත්, ඔහුට නියමිත වැටුප් තලය වන රු. 190,140/- හි පිහිටුවා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරෙහි නියමිත වැටුප සකස් කර දෙන ලෙසත්, අධ්‍යක්ෂක තනතුරේ වැටුප නියමිත පරිදි සකස් කර දෙන ලෙස සහ සවිස්තර ප්‍රකාශයේ ඉල්ලා ඇති සහනයන් ලබාදෙන ලෙසත්ය.

මෙහිදී මූලික සාක්ෂි මත මතුවූ කරුණු සම්බන්ධයෙන් පැහැදිළි කර ගැනීම සඳහා ඉල්ලුම්කරුගෙන් පහත සඳහන් ප්‍රශ්න අධිකරණය විසින් අසන ලදී.

ප්‍රः සේවකයෙකුට පෞද්ගලික වන සේ කියලා වැටුප නියම කළේ ඇයි? ඒකට හේතුව දන්නවාද?

උः එක දන්නේ නැහැ ස්වාමිණි

ප්‍රः මෙම ලේඛනවල තියෙනවා නේද සාවද්‍ය වැටුප් තලවල පිහිටුවලා තිබෙන නිසා කියලා?

උः එසේය ස්වාමිනී, එම තත්ත්වය නිසා නිවැරදි කරන්නේ ඊට පසුව

ප්‍රः සාවද්‍යව වැටුප් තලයක පිහිටුවලා තිබෙනවා කියලා තිබෙනවා?

උ : ඔව්. සංදේශයේ තිබෙනවා.

ප්‍ර : ලේඛනයේ තිබෙනවා ඔබත් සමග එම ආයතනය ගිවිසුමකට පත්වීම නිසා එය නිවැරදි කරන තෙක් ඔබගේ වැටුප පෞද්ගලික සේ සලකනවා කියලා සංදේශයක තිබෙනවා නේද?

උ : ඔව්.

ප්‍ර : සාවද්‍යව වැටුප් තලයක් තිබෙනවා කියන එකට ඔබලා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්තාද එහෙම නැහැ කියලා?

උ : 2006. 09. 08 වන දනමින් එව්ව ලිපියට අනුව කමිටුවට අනුව මා විරෝධතාවය ප්‍රකාශ කරලා අධ්‍යක්ෂක ජෙනරාල්තුමාට ලිපියක් යොමු කළා මේක කරන්නට එපා මේක වැරදියි කියලා.

ප්‍ර : ඒකට මොකක්ද වුණේ ඊට පසුව

උ : ඒකට මුකුත් වුනේ නැහැ අවුරුදු 6 ක් 7 ක් යනතුරු ලිපියක් එව්වේ නැහැ.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් වෙන නීතිමය ක්‍රියාමාර්ගයක් ගත්තාද?

උ : මම නිරන්තරයෙන්ම ලිපි ලියා කිව්වා මට මේ ටික ලබාදෙන්න කියලා

ප්‍ර : ඔය 2006 නේද?

උ : ඔව්.

ප්‍ර : A5 කියලා ලේඛනයක් ලකුණු කළා නේද?

උ : ඔව්.

ප්‍ර : එහි තිබෙනවා නේද 2/97/3 "අනුව රාජ්‍ය නිලධාරින් සඳහා අනුමත නව වැටුප් පරිමාණ අනුකූලව හිමිවිය යුතු වැටුප් වැඩිවීම 1997/01/01 වන දිනට ගෙවීමටත්, ඉතිරි 60% ක වැටුප් වැඩිවීම මාණ්ඩලික නිලධාරි සඳහා 1997. 07. 01 වන දිනට ගෙවීමටත් නියමව තිබුණි. එහෙත් මෙම මාණ්ඩලික නිලධාරින් සඳහා 60% ක වැටුප් වැඩිවීම ඔවුන්ගේ වැටුපට එකතුකොට 1997/01/03 වන දිනට ගෙවා තිබේ" කියලා තිබෙනවා නේද?

උ : ඒක ප්‍රතික්ෂේප කරන්න වෙනවා අපිව විශ්‍රාම ගැන්වූයේ 1997. 03. 01 වන දින. 1997. 03. 01 වන දින විශ්‍රාම ගැන්වූවාට පසුව අපිට ඒ සම්පූර්ණ වැටුපම හිමියි ස්වාමිණි?

ප්‍ර : අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුවනේ ඒක තීරණය කරලා තිබෙන්නේ?

උ : නැහැ ස්වාමිණි. අපිට ඒක 3/97 බී. සී පැරා වැටුප් වාර්තාවෙන්ම කෙළින්ම නිර්දේශ කරලා තිබෙනවා. කෙනෙක් 1998. 01. 01 ට පෙර විශ්‍රාම යනවානම් ඔහුට සම්පූර්ණ වැටුපම දියයුතුයි කියලා වගන්තියක් තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : මෙතන 40 %, 60% කියලා අදහස් කරන්නේ කුමක්ද?

උ : වැටුප් වැඩිවීම අවස්ථා දෙකකදී දුන්නේ එකක් දුන්නා 1997. 01. 01 ට අනිත් එක දුන්නා 1996. 01. 01 ට

ප්‍ර : නමුත් මෙතන කියන්නේ විශ්‍රාම සහ පාර්තෝසිතය ගැන නෙවෙයිනේ?

උ : නැහැ.

ප්‍ර : මේ ලිපියෙන් කියන්නේ ඔබලාට ඒ වැටුප් වැඩිවීම කරනකොට 1998. 07. 01 වන දිනට වෙන්න තිබෙන වැටුප් වැඩිවීම 1997. 07. 01 වන දින ඉදලම දුන්නා කියලා.

උ : ඒක හරි ස්වාමිණි.

ප්‍ර : ඒක වැරදියි කියලානේ ඒගොල්ලෝ කියන්නේ?

උ : විශ්‍රාම ගැන්වූ කෙනෙක් වශයෙන් අවසාන වැටුප කියලා කියන්නේ අපිට සම්පූර්ණ වැටුප වැඩිවීම දෙන්න ඕන.

(2022.10.10 ප. ව. 1.30 ට ඉෂානි චතුරිකා බොතේජු
මියගේ සටහන් පිටු 10 සිට 13 දක්වා)

ඉහත සාක්ෂි මත ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කර සිටිනු ලබන්නේ ඔහුට සාවද්‍ය වැටුප් වැඩිවීමක් සිදුවී නොමැති බවකි.

ඉල්ලුම්කරුගේ සාක්ෂි මෙහෙයවීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වයට ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවසර ලබාදෙන ලදී. එහිදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් කියා සිටියේ, ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න නොඅසන බවත්, ඒ සම්බන්ධයෙන් ලිඛිත දේශන මගින් කරුණු ඉදිරිපත් කරන බවත් ය.

ඒ අනුව බේරුම්කරණය විමසීම අවසන් කරන ලද අතර දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කරන ලෙසත් දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න නොඅසා ලිඛිත දේශන ඉදිරිපත් කිරීම තුළින් දෙවන පාර්ශ්වයෙන් පළමු පාර්ශ්වයට නැවත ප්‍රශ්න විමසීමට ඉඩ ප්‍රස්තාවක් නොලැබීමේ හේතුව මත අවශ්‍ය නම් පළමු පාර්ශ්වයට දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත දේශනවලට පිළිතුරු ලෙසට ලිඛිත දේශනයක් නැවතත් ගොනු කිරීමට අවසර දෙන ලදී.

මෙහිදී දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරුනු ලැබූ ලිඛිත දේශන මගින් සඳහන් කරනු ලබන්නේ, ඉල්ලුම්කරුව පළමුව රු. 168,060/- දරන වැටුප් පියවරේ තැබූ බවත්, පසුව ඉල්ලුම්කරුව රු. 190,140/- වැටුප් තලයක පිහිටුවා ඇති අතර එය සාවද්‍ය වැටුපක් හෙවත් අනුකූල නොවන අයුරින් වැටුප් පරිවර්තනයක් සකසා තිබීමක් ලෙසත්ය. නමුත් මෙවැනි අවස්ථාවක ඔවුන්ගේ ප්‍රතිලාභ සංශෝධනය කිරීම මගින් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙසට සලකා මීළඟ වැටුප් ප්‍රතිශෝධනයක දී නැවත වැටුප් තල සකස් කිරීමේ පදනම මත වත්මන් වැටුප ඔවුන්ට පෞද්ගලික වන සේ සැලකීම මැනවැයි යෝජනාකර ඇති බව ලේඛන මත කියා සිටී.

එකී කරුණ පලමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කරුට ඔහුගේ සාක්ෂියෙන්

පසුව 2004. 01. 01 හා 2004. 12. 01 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 21 සහ 25 වැටුප් ගෙවීම 2005. 02. 18 දින සිට නවතා ඇති බවට දක්වා ඇත. ඉන්පසු 2006. 06. 14 වන දින කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් මෙතෙක් ඉල්ලුම්කරු භුක්ති විඳි වැටුප රු. 160,060 දක්වා අඩුකර ඇත.

ඒ අනුව දෙවන පාර්ශවය තම ලිඛිත දේශන මත කියා සිටින්නේ ඉල්ලුම්කරුට හිමිවිය යුතු වැටුපට වඩා වැඩි වැටුපක් උපයාගෙන ඇති බැවින් ඉල්ලුම්කරුගේ වැටුප් පියවර සංශෝධනය කළ බවත්, ඒ අනුව මෙම ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසත්ය.

මෙහිදී බේරුම්කරණ අධිකරණයට විසඳිය යුතු වන්නේ, ඉල්ලුම්කරු විසින් පුරා අවුරුදු 09 ක් භුක්ති විඳිමින් සිටි වැටුප දෙවන පාර්ශවය විසින් අඩු කිරීම තුලින් පළමු පාර්ශවකරුට අසාධාරණයක් සිදු වී ඇත්දැයි සොයා බැලීම වේ.

දෙවන පාර්ශවය විසින් ලිඛිත දේශන මගින් ලේඛන ඉදිරිපත් කර සිටියද පළවන පාර්ශ්වයෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් නොඇසීම මත සහ දෙවන පාර්ශ්වය වෙනුවෙන් කිසිදු සාක්ෂියක් නොකැඳවමින් ඔවුන් විසින් ලේඛණ මත පමණක් පළවන පාර්ශ්වය සාවද්‍ය වැටුප් පියවරක් තැබූ බවට ප්‍රකාශ කර සිටියද එකී කරුණ පළවන පාර්ශවය විසින් ප්‍රතික්ශේප කරමින් ඔහු නිවැරදි වැටුප් තලයේ සිටින බවට සාක්ෂි දෙන ලදී.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී පෙනීයන්නේ ඇමති මණ්ඩලයේ තීරණයක් මත ඔහුට පෞද්ගලික වන සේ පිහිටුවා ඇති වැටුප් පියවර 2006 වර්ෂයේදී අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලේඛණය මත ඉල්ලුම්කරුගේ වැටුප් පියවර රු. 190,040 සිට රු. 184,060 දක්වා පහත දැමීමෙන් පළවන පාර්ශවය විසින් අවුරුදු 09 ක් පුරා භුක්ති විඳි වැටුප අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අඩු කිරීම මත පළමු පාර්ශවයේ අයිතිවාසිකම් උල්ලංඝනය වන බවත්, එමගින් පළවන පාර්ශ්වකරුට අසාධාරණයක් සිදු වී ඇති බවට මා නිගමනය කරමි.

මෙසේ පහත දමා ඇත්තේ 2006 වර්ෂයේ සිට බවත් ඔහු විශ්‍රාම ගොස් ඇත්තේ 2011 වර්ෂයේදී වන බවත්, ඒ අනුව අවුරුදු 06 ක් පලවන පාර්ශවකරු වන ඉල්ලුම්කරුගේ වැටුප අඩු වී ඇති බව පෙනීයන කරුණකි.

එසේම ඔහුගේ සාක්ෂි මත ප්‍රකාශ කර ඇත්තේ, එමගින් වාර්ෂිකව රු. 22,080 ක් පමණ අලාභයක් සිදුව ඇති බවයි.

ඒ අනුව රු. 22080 x 6 = රු. 132,480 ක මුදලක් මෙම ප්‍රදනය *ගැසට්* පත්‍රයේ පලවූ දින සිට මසක් ඇතුළත එම සේවකයාට ලබාගත හැකි වන පරිදි කම්කරු දෙපාර්තමේන්තුවේ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියම කරමි.

මෙහිදී පළවන පාර්ශ්වය විසින් ඉල්ලා ඇති අනිකුත් සහනයන් සම්බන්ධයෙන් ගරු අධිකරණයේ ඉදිරියේ නිසිලෙස සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින් එකී කරුණු සම්බන්ධයෙන් මා විසින් කිසිදු නියෝගයක් නොකරන බවත් එකී ඉල්ලීම් කම්කරු කොමසාරිස්වරයා වෙතින් ඉල්ලීමක් කිරීමට මෙම ප්‍රදනය බාධාවක් නොවන බවත්, මා තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත තීරණයකි.

ටී. එස්. ජේ. පීරිස්
බේරුම්කරු

2023 මාර්තු මස 28 වන දින

EOG 06 - 0148

---

මගේ අංකය: IR/COM/02/2019/270.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.09 දිනැති හා අංක 2314/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.01.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මීගොඩ, මුතුහේන වත්ත, නඳුන් උයන, අංක 102/33 ඒ හි පදිංචි එච්. කේ. කේ. හීනටිගල මෙනවිය සහ බත්තරමුල්ල,

සෙත්සිරිපාය , 06, 07 හා 09 වන මහල හි පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

එච්. කේ. කේ. හීනටිගල,
අංක 102/33/ඒ,
නඳුන් උයන,
මුතුහේන වත්ත,
මීගොඩ.

පළමුවැනි පාර්ශ්වය

සහ

නඩු අංකය: A/09/2023
IR/COM/02/2019/270

නාගරික සංවර්ධන අධිකාරිය,
06, 07 හා 09 වන මහල්,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

දෙවන පාර්ශ්වය

**අතර පවත්නා කර්මික ආරවුල**

**පෙනී සිටීම -**

පළමු පාර්ශවය වෙනුවෙන් - ඉල්ලුම්කරු සහ නීතිඥ ශෂික හෙට්ටිආරච්චි මහතා

දෙවන පාර්ශවය වෙනුවෙන් - 01. නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් නීති නීති නිලධාරිනි ටිෂානියා සෙනෙවිරත්න මහත්මිය
02. මානව සම්පත් කළමනාකාර නිලධාරිනි ඩබ්. ඒ. ශ්‍යාමලී දිල්හානි මහත්මිය
03. රජයේ නීතිඥ හාජර් අසාර් මෙනවිය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ :

''නාගරික සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු එච්. කේ. කේ. හිනටිගල මෙනවියට,

පරිපාලන නිලධාරි තනතුර 2002.07.01 දිනට පෙර දතම කර හිමිද ? හිමිනම් එය ලබා නොදීම
සහකාර අධ්‍යක්ෂක තනතුර 2007.07.01 දින සිට පෙර දතම කර හිමිද ? හිමිනම් එය ලබා නොදීම
නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරය හිමිද ? හිමිනම් එය කවරද සිට හිමිද යන්න හා එය ලබා නොදීම
වෘත්තීය දීමනාව හිමිද ? හිමිනම් එය කවරද සිට හිමිද යන්න හා ලබා නොදීම
යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද ? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.''

මෙම නඩුව ප්‍රථමවරට 2023.01.23 වන දින කැඳවූ අතර එහිදී පළමු පාර්ශවය විසින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් පළමු ප්‍රකාශය ගොනුකර තිබූ අතර පෙර දැනුම්දී තිබියදීත් දෙවන පාර්ශවය විසින් පළමු ප්‍රකාශ ගොනුකර නොතිබුණි. එම නිසා දෙවන පාර්ශවය විසින් පළමු ප්‍රකාශය එදිනට පසුදින වන 2023.01.24 වන දින සවස 4.00ට පෙර පිටපත් තුනකින් යුතුව ඉදිරිපත් කරන බවට පොරොන්දු විය. ඒ අනුව මෙම නඩු විභාගය 2023.04.04 වන දින පෙරවරු 9.30 දක්වා කල් තැබිණි.

මෙම නඩුව නැවතත් 2023.04.04 දින කැඳවූ අවස්ථාවේදී දෙවන පාර්ශවය තම පළමු ප්‍රකාශ නියමිත පරිදි ගොනුකර තිබූ අතර ඒ අනුව පළමු පාර්ශවය සිය දෙවන ප්‍රකාශයද දෙවන පාර්ශවයට පිටපත් සහිතව බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. පැමිණිලිකාර පාර්ශ්වය තම දෙවන ප්‍රකාශය කලකට පෙර ඉදිරිපත්කර තිබියදී සහ දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර පාර්ශ්වය, මෙදින (2023/04/04දින ) මෙම නඩුව විභාගයට ගන්නා බව තීන්දු කර තිබියදීත් තම දෙවන ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ හාජර් අසාර් මෙනවිය දෙවන ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කල් ඉල්ලා සිටින ලදී. ඒ අනුව අප්‍රේල් මස 29 වන දිනට ප්‍රථම සිය දෙවන ප්‍රකාශය පළමු පාර්ශ්වයටද පිටපත් සහිතව බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. එසේ වුවත් කළින් තීන්දු කරගත් පරිදි මෙම නඩුව එදින විභාගයට ගත් අතර පැමිණිලිකාර පාර්ශ්වයේ නීතිඥ ශෂික හෙට්ටිආරච්චි මහතා විසින් පැමිණිලිකාරියගේ මූලික සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී. මෙම නඩුවට අදළ ප්‍රස්තුත කරුණ සම්භන්ධයෙන් ඉදිරි සාක්ෂි මෙහෙයවීම සඳහා පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ඉදිරි දිනයක් ඉල්ලා සිටි බැවින් මෙම නඩුව 2023.05.11 වන දින පස්වරු 12.30 දක්වා කල්තබන ලදී.

මෙම නඩුව නැවතත් දෙවෙනිවරට 2023.05.11 වන දින පස්වරු 12.30 ට කැඳවූ අවස්ථාවේදී පැමිණිලිකාරිය වන එච්. කේ. කේ. හිනටිගල මෙනවිය හෝ ඇය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයෙකු පෙර දැනුම්දීමකින් තොරව ඉදිරිපත් නොවූ අතර දෙවන පාර්ශවය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ රජයේ නීතිඥවරිය පෙනී සිටින ලදී. එහිදී අධිකාරිය වෙනුවෙන් කරුණු දක්වූ රජයේ නීතිඥ හාජර් අසාර් මෙනවිය ප්‍රකාශ කර සිටියේ තම දෙවන ප්‍රකාශය ඉදිරිපත් කිරීමට මෙම නඩුව පෙර කැදවූ 2023.04.04 දිනයේදී දීර්ඝ කාලයක් ඉල්ලා සිටියද එහිදී පළමු පාර්ශ්වය විසින් විරෝධතාවයක් ඉදිරිපත්කර කෙටි දිනයක් ඉල්ලා සිටි බැවින් දෙපාර්ශ්වයේ එකඟතාවය මත 2023.05.11 වන දින නඩුව නැවත විභාගයට කැදවූ බවත් ඒ අනුව එදින මෙම නඩුවට පෙනීසිටීමට පැමිණිලිකාර පාර්ශ්වයට වගකීමක් ඇති බවත් පෙන්වා දෙන ලදී. මෙම විරෝධතාවය සැළකිල්ලට ගෙන මෙම නඩුව නිෂ්ප්‍රභා කරන ලෙසද දෙවන පාර්ශ්වය විසින් ගරු බේරුම්කරණ අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

තවද මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් දෙවන පාර්ශ්වය දන්වා සිටියේ පළමු පාර්ශ්වය විසින් සිය පැමිණිල්ල, පැමිණිලිකාරිය විශ්‍රාම ගොස් කාලයකට පසු ඉදිරිපත් කර ඇති බැවින්ද, දෙවන පාර්ශ්වය සහ පැමිණිලිකාරිය අතර සේවක සම්බන්ධතාවයක් මේ අවස්ථාවේ නොමැති බැවින්ද, මෙය සජීවී ආරවුලක් නොවන හෙයින් මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා කරන ලෙස බේරුම්කරණ අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් කරනු ලැබූ පළමු හා දෙවන ප්‍රකාශ සලකා බැලීමෙන් අනතුරුව කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වලට අදළව දෙවන පාර්ශ්වය වන නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලන නිලධාරී තනතුර, සහකාර අධ්‍යක්ෂ තනතුර, නියෝජ්‍ය අධ්‍යෂක ධූරය අධිකාරියේ නීතිරීති, කළමනාකාර සේවා චක්‍රලේඛ සහ උසස්වීම් පටිපාටිය අනුගමනය කරමින් ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර පැමිණිලිකාර පාර්ශවයට හිමි වෘත්තිය දීමනාද අධිකාරියේ කළමනාකාර මණ්ඩල පත්‍රිකා අනුව හිමි නොවන බවත් නිරීක්ෂණය වේ.

**නියෝගය**

බේරුම්කරණ නඩුවට අදාලව දෙපාර්ශ්වයේම ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශයන් අනුව නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලන නිලධාරී තනතුර, සහකාර අධ්‍යක්‍ෂය තනතුර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය අධිකාරියේ නීතිරීති, කළමනාකාර සේවා චක්‍රලේඛ සහ උසස්වීම් පටිපාටිය අනුගමනය කරමින් ලබා දී ඇති බැවිනුත් මෙය සජීවී ආරාවුලක් නොවන හෙයිනුත්, කිසිදු පෙර දැනුම්දීමකින් තොරව දෙපාර්ශවය එකඟවූ පරිදි මෙදින පැමිණිලිකාර, පළමු පාර්ශ්වය වන එච්. කේ. කේ. හිනටිගල මෙනවිය හෝ ඇය වෙනුවෙන් පෙනීසිටින නීතිඥයෙකු හෝ නඩු විභාගයට පෙනී නොසිටි හෙයිනුත් මෙම නඩුව නිෂ්ප්‍රභා කරන බව දන්වමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත නියෝගයක් බව සහතික කරමි.

රමාල් අයි සිරිවර්ධන,
බේරුම්කරු.

2023 මැයි මස 17 වන දින.

EOG 06 - 0149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.